සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 11 | S | I |
|---|---|---|---|---|

**බුද්ධ ධර්මය I** — කාලය පැය තුනයි

සැලකිය යුතුයි.
* සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. සිදුහත් බෝසතාණෝ මුහුණදුන් අභියෝගයකි.
1. දසමාර සේනා පරාජය කිරීම.
2. පංචමහා විලෝකනය.
3. මාරදූවරුන් හමුවේ නොසැලී සිටීම.
4. බුදු සසුනේ තනතුරු ප්‍රදාන කිරීම.

02. බුදුන් වහන්සේ ලෝක සත්ත්වයන්ට හිතසුව පිණිස ධර්ම චාරිකාවේ යෙදුණේ,
1. අවුරුදු අසූවකි.
2. අවුරුදු දහසයකි.
3. අවුරුදු හතලිස් පහකි.
4. අවුරුදු විසිනවයකි.

03. මහා සංඝරත්නය මනා වූ පිළිවෙත් පුරන බැවින්,
1. ආහුණෙය්‍යය නම් වන සේක.
2. පාහුණෙය්‍යය නම් වන සේක.
3. සුපටිපන්න නම් වන සේක.
4. සාමීචිපටිපන්න නම් වන සේක.

04. ලෝකයේ වෙනස්වන සුළු ස්වභාවය වටහාගෙන මැදිහත්ව ඒවාට මුහුණ දීමටත් මානසික දුක්පීඩා විඳ දරා ගැනීමටත් උපකාරී වන්නේ,
1. චින්තා භාවනාව යි.
2. සමාධි භාවනාව යි.
3. විදර්ශනා භාවනාව යි.
4. සමථ භාවනාව යි.

05. සිත කිළිටි කරන කුසල් සිත් වලට බාධා කරන නීවරණ සිතුවිලි අතර උද්ධච්ච කුක්කුච්ච නීවරණය උපමා කර ඇත්තේ,
1. වර්ණවත් ජලයට ය.
2. පාසි සහිත ජලයට ය.
3. බොර ජලයට ය.
4. කැළඹුණු ජලයට ය.

06. ශ්‍රී ලංකාවේ නැති වී ගිය උපසම්පදාව නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අරමුණින් සියම් දේශයෙන් ලක්දිවට උපසම්පදා ලත් භික්ෂූන් වැඩම වූයේ,
1. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේ ය.
2. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කාලයේ ය.
3. වීර පරාක්‍රම නරේන්ද්‍ර සිංහ රජුගේ කාලයේ ය.
4. කීර්ති ශ්‍රී මේඝවර්ණ රජුගේ කාලයේ ය.

07. "උඩගු නොව මහණ" යන වදන් පිවිසුම් දොරටුවෙහි ලියා තබමින් තම ජීවිතයට නව අරුතක් ගෙන ඒමට හැම විටම උත්සාහ දැරුවේ,
1. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ය.
2. වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමියන් ය.
3. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් ය.
4. වීදාගම මෛත්‍රී හිමියන් ය.

08. දුටුගැමුණු රජතුමා විසින් සිදුකළ සේවාවක් නොවන්නේ,
1. ගිලන් හල් සේවාව ආරම්භ කිරීම.
2. වෙසක් උත්සව විසි හතරක් පැවැත්වීම.
3. මහවැව් හැටහතරක් ප්‍රතිසංස්කරණය කිරීම.
4. රුවන් වැලි මහා සෑය ඉදි කිරීම.

09. " උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ" මෙහි "නිසම්මකාරිනෝ" යන්නෙහි අර්ථය වනුයේ,
1. උත්සහවන්ත බව යි.
2. විමසා බලා කටයුතු කිරීම යි.
3. පිරිසිදුව කටයුතු කිරීම යි.
4. මනා හික්මීමෙන් කටයුතු කිරීම යි.

10. යහපත් සම්බන්ධතා ගොඩනගා ගැනීමට යුතුකම් හා වගකීම් ඉටු කළ යුතු බව දක්වෙන්නේ,
1. මහා මංගල සූත්‍රයේ ය.
2. ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ ය.
3. පරාභව සූත්‍රයේ ය.
4. සිගාලෝවාද සූත්‍රයේ ය.

11. රාගී කෙලෙස් වලින් තොරවූ පිරිසිදු සිත් ඇති උතුමන් පියුමකට උපමා කර ඇත. මෙහිදී මඩෙහි ඉපිද ජලයෙන් උඩට විත් ජලය හා අසම්බන්ධිතව පිපුණු නෙළුමෙන් උපමා කර ඇත්තේ,
1. උත්තම පෞරුෂ ඇත්තෝ ය.
2. අවම පෞරුෂ ඇත්තෝ ය.
3. මධ්‍යම පෞරුෂ ඇත්තෝ ය.
4. අධම පෞරුෂ ඇත්තෝ ය.

12. තමා උපමා කරගෙන අන්‍යයන්ට හිංසා නොකර සිටීමේ ප්‍රතිපදාව බුදුදහමේ හඳුන්වන්නේ,
1. අධිපති ධර්ම ලෙසයි. 2. ත්‍රිකෝටි පාරිශුද්ධ ශීලය ලෙසයි.
3. අත්තූපනායික ධර්මය ලෙසයි. 4. පංචශීලය ලෙසයි.

13. "භාග්‍යවත් ගෞතමයන් වහන්ස, මේ මිනිස් ලොව ජීවත් වන හැමදෙනාම එක සමාන නැත." මේ ආකාරයට ලෝකයේ මිනිසුන් අතර වෙනස්කම් ඇතිවීමට හේතු කවරේද? යන්න බුදු රජාණන් වහන්සේගෙන් විමසනු ලැබුවේ,
1. තෝදෙය්‍ය බ්‍රාහ්මණයා ය. 2. මඝ මානවකයා ය. 3. ඡත්ත මානවකයා ය. 4. සුභ මානවකයා ය.

14. කාලයට අනුව කර්මය ප්‍රභේද ගත කිරීමේදී දෙවන ආත්මයෙන් පසු කවර හෝ ආත්ම භවයකදී විපාක දීමට ඉදිරිපත් වන කර්මය,
1. දිට්ඨධම්ම වේදනීය කර්මය යි. 2. උපපජ්ජවේදනීය කර්මය යි.
3. අපරාපරියවේදනීය කර්මය යි. 4. අහෝසි කර්මය යි.

15. දස අකුසල කර්මයන්ගෙන් අභිධ්‍යාව ලෙස හඳුන්වා දී ඇත්තේ,
1. දැඩි ලෝභය යි. 2. දැඩි තරහව යි. 3. වැරදි වැටහීම යි. 4. දැඩි රැවටීම යි.

16. කර්මයේ බලපෑම වර්තමාන කර්ම වලින් සහ පරිසර සාධක ඇසුරින් වෙනස් කරගත හැකිය. ඉසුරු පිරුණු ස්ථානයක ඉපදීමෙන් කර්මය වෙන් කර ගැනීම,
1. උපධි සම්පත්තිය යි. 2. ගිහි සම්පත්තිය යි. 3. කාල සම්පත්තිය යි. 4. ප්‍රයෝග සම්පත්තිය යි.

17. පංචස්කන්ධයෙහි මිරිඟුවකට උපමා කර ඇත්තේ,
1. රූප ස්කන්ධය යි. 2. වේදනා ස්කන්ධය යි. 3. සඤ්ඤා ස්කන්ධය යි. 4. සංඛාර ස්කන්ධය යි.

18. "ඔබ වහන්සේ පැවිදි වූයේ කවරෙකු උදෙසාද? ඔබ වහන්සේගේ ගුරුතුමා කවරෙක් ද? කාංගේ දහමක් රුචිකරන්නේද යනාදී ලෙස විමසනු ලැබුවේ,
1. අස්සජි හිමියන් විසින් උපතිය පිරිවැජියාගෙන් ය.
2. අස්සජි හිමියන් විසින් බුදුන්වහන්සේගෙන් ය.
3. උපතිස්ස පිරිවැජියා විසින් අස්සජි මහරහතන් වහන්සේගෙන් ය.
4. කෝලිත පිරිවැජියා විසින් අස්සජි මහරහතන් වහන්සේගෙන් ය.

19. බුදුරජාණන් වහන්සේ විසින් චතුරාර්ය සත්‍යය ධර්මය ඇතුලත්කොට දේශනා කරන ලද සූත්‍ර දේශනාවක් වන්නේ,
1. අනත්ත ලක්ඛණ සූත්‍ර දේශනාවයි. 2. ව්‍යග්ඝ පජ්ජ සූත්‍ර දේශනාවයි.
3. සේලා සූත්‍ර දේශනාවයි . 4. ධම්ම චක්කපවත්තන සූත්‍ර දේශනාවයි.

20. දුක්ඛ නිරෝධගාමිණී පටිපදා ආර්ය සත්‍යයෙහි නෙක්ඛම්ම, අව්‍යාපාද, අවිහිංසා යන කල්පනාවන්ගෙන් යුක්ත වීම අයත් වන්නේ,
1. සම්මා දිට්ඨිය යි. 2. සම්මා සංකප්පයට යි. 3. සම්මා කම්මන්තයට යි. 4. සම්මා ආජීවයට යි.

21. බුදුරජාණන් වහන්සේ ස්වභාවික පරිසරය ආශ්‍රිතව වස් විසූ අවස්ථාවන් අතර විශාලා මහනුවර කූටාගාර ලෙනෙහි වස් කාලය වන්නේ,
1. පළමු වස් කාලයයි. 2. පස්වන වස් කාලයයි. 3. දහවන වස් කාලයයි. 4. අටවන වස් කාලයයි.

22. බුදුරජාණන් වහන්සේ විසින් කායික රෝග ඇතිවීමට බලපානු ලබන හේතු කාරණයන් අටක් විස්තර කර දෙමින් දේශනා කරන ලද සූත්‍රය වන්නේ,
1. ගිරිමානන්ද සූත්‍රය යි. 2. භද්දාලි සූත්‍රය යි. 3. දෝණපාක සූත්‍රය යි. 4. මොග්ගල්ලාන සූත්‍රය යි.

23. නැගිට ගැනීමට බැරි තරමට ආහාර ගෙන එහිම පෙරළී සිටින තැනැත්තා බෞද්ධ සාහිත්‍යයේ හඳුන්වා දී ඇත්තේ,
1. ආහාර හත්ථක ලෙසයි. 2. තත්ථා වට්ටක ලෙසයි.
3. අලංසාටක ලෙසයි. 4. හුත්ත වමිතක ලෙසයි.

24. බුදුන් වහන්සේ විසින් පමණ ඉක්මවා ආහාර ගැනීමේ ඇති අහිතකර තත්වය පැහැදිලි කරමින් කරුණු දේශනා කළේ,
1. බිම්බිසාර රජතුමාට ය. 2. අනේපිඬු සිටුතුමාට ය.
3. අජාසත් රජතුමාට ය. 4. කොසොල් රජතුමාට ය.

25. හතරවෙන සාර්වාස්තිවාදී ධර්ම සංගායනාව පැවැත්වූයේ,
1. මාතලේ අලුවිහාරයේදී ය. 2. කාශ්මීර කුණ්ඩලවන විහාරයේදී ය.
3. විශාලා මහනුවර වාලුකාරාමයේදී ය. 4. පැළලුප් නුවර අශෝකාරාමයේදී ය.

26. මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලංකාවේ ඉදිවූ ප්‍රථම ස්තූපය වන්නේ,

1. ථූපාරාම චෛත්‍යය යි. 2. මහියංගන චෛත්‍යය යි. 3. ගිරිහඬු සෑයයි. 4. රුවන්වැලි මහා සෑයයි.

27. බුදුන්වහන්සේ තුළ පැවති පුරිසදම්ම සාරථී ගුණය මුල්කර ගනිමින් රචනා කරන ලද කෘතියකි.
1. බුත්සරණ 2. අමාවතුර 3. පූජාවලිය 4. මුවදෙව්දාවත

28. දඹදෙණි යුගයේ දෙවන පැරකුම් රජු විසින් රචනා කරන ලද මහා කාව්‍යයකි.
1. කව්සිළුමිණ 2. සස ජාතකය 3. කාව්‍යශේඛරය 4. ලෝවැඩ සඟරාව

29. වජ්ජී දේශයේ ලිච්ඡවී රජ දරුවන් විසින් අනුගමනය කළ දැහැමි රාජ්‍ය පිළිවෙතකි.
1. දසරාජ ධර්ම 2. සප්ත අපරිහානීය ධර්ම 3. දස සක්විතිවත් 4. සතර සංග්‍රය වස්තු

30. ලොව පවත්නා කිසිවක් හුදකලාව නොපවතී. එක් දෙයක පැවැත්ම උදෙසා තවත් දෑ තිබිය යුතුය. මේ න්‍යාය තුළින් තහවුරු වන මූලධර්මය වන්නේ,
1. ත්‍රිලක්ෂණ ධර්මය යි. 2. අභිධර්මය යි.
3. පටිච්චසමුප්පාද ධර්මය යි. 4. අනාත්ම ධර්මය යි.

31. සිඟාලෝවාද සූත්‍රයට අනුව පුබ්බ දිසා හෙවත් නැගෙනහිර දිශාවෙන් නියෝජනය වන්නේ,
1. දෙමව්පියන් හා දූ දරු සම්බන්ධතාවයයි. 2. ගුරු හා ශිෂ්‍ය සම්බන්ධතාවයයි.
3. ගිහි හා පැවිදි සම්බන්ධතාවයයි. 4. සේවක සේව්‍ය සම්බන්ධතාවයයි.

32. බුදුන්වහන්සේගෙන් ඔබ දෙවියෙක්ද, ගාන්ධර්වයෙක්ද, යක්ෂයෙක්ද, මනුෂ්‍යයෙක්ද යන්න විමසා සිටියේ,
1. පිලෝතික බ්‍රාහ්මණයාය. 2. ද්‍රෝණ බමුණාය.
3. තෝදෙය්‍ය බමුණාය. 4. පොට්ඨපාද පිරිවැජියාය.

33. පරලොවක් නැතැයි යන පිළිගැනීම මත මෙලොව වශයෙන් හැකිතාක් සැප විඳීමට ඇති ආශාව,
1. කාම තණ්හාව යි. 2. භව තණ්හාව යි. 3. විභව තණ්හාව යි. 4. ධන තණ්හාව යි.

34. භාවනාවට පිවිසෙන තැනැත්තා පූර්ව අවශ්‍යතා පහක් ඉටුකරගත යුතුය. එම අවශ්‍යතා වලට අයත් නොවන්නේ,
1. සිල්වත් වීම යි. 2. ප්‍රඥාව යි. 3. කරුණාව යි. 4. වීර්යය යි.

35. පංචෙන්ද්‍රියන්ගෙන් අරමුණු හැඳින ගැනීමත් සමගම පහළ වන දැකීම,
1. වේදනා ස්කන්ධය යි. 2. විඤ්ඤාණ ස්කන්ධය යි. 3. සංඛාර ස්කන්ධය යි. 4. සඤ්ඤා ස්කන්ධය යි.

36. වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමිපාණන් විසින් රචිත කෘතියකි.
1. මුණිගුණ අලංකාරය. 2. බුදු ගුණ අලංකාරය.
3. පොහොය දිනය. 4. බෞද්ධයාගේ අත්පොත.

37. සතර සංග්‍රහ වස්තු පිළිවෙලින්
1. ඡන්දය, ද්වේෂය, භය, මෝහයයි යන්නයි.
2. දානය, ප්‍රිය වචනය, අර්ථ චරියාව, සමානාත්මතාවයයි යන්නයි.
3. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛායි යන්නයි.
4. ඡන්ද, චිත්ත, වීරිය, විමංසා යන්නයි.

38. ධම්ම පදය අයත් වන පිටකය හා ගාථා ගණන පිළිවෙලින්,
1. විනය පිටකය , ගාථා 432 යි. 2. සූත්‍ර පිටකය , ගාථා 432 යි.
3. විනය පිටකය , ගාථා 423 යි. 4. සූත්‍ර පිටකය , ගාථා 423 යි.

39. දිවා රෑ පිං වැඩෙන කරුණු අයත් නිවැරදි වරණය වන්නේ,
1. ඒදඬු පාලම්, පැන් පොකුණු තනා දීම යි. 2. සතර අගතියෙන් තොරව කටයුතු කිරීම යි.
3. කඨින චීවර, පිරිත් පොත් ආදිය පූජා කිරීම යි. 4. ධාර්මික ප්‍රතිපත්තියක පිහිටා ධනය රැස්කිරීම යි.

40. බුදුරජාණන් වහන්සේ රූප සම්පත්තිය හෙවත් බාහිර පෞරුෂය පිළිබඳ ප්‍රසාදයෙන් උන්වහන්සේ අනුගමනය කළේ,
1. වක්කලී තෙරුන් වහන්සේ ය. 2. නන්ද තෙරුන් වහන්සේ ය.
3. ආනන්ද තෙරුන් වහන්සේ ය. 4. පිප්පලී තෙරුන් වහන්සේ ය.

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 11 S II

# බුද්ධ ධර්මය II

සැලකිය යුතුයි.

* පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
* පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද 2 සිට 6 දක්වා ප්‍රශ්න සඳහා ලකුණු 2, ලකුණු 3, ලකුණු 5 බැගින් පිරිනැමේ.
* හත්වන ප්‍රශ්නයට ලකුණු 5 බැගින් ලකුණු 10කි.

01. (i) බෝසතාණෝ තමන් වහන්සේගේ අවසන් උපත සඳහා සුදුසු පසුබිම නුවණින් විමසා බැලීම හැඳින්වෙන්නේ කෙසේද?
 (ii) "භාවේති කුසල ධම්මේ අසේවති වඩ්ඩේති ඒතායාති භාවනා" මෙහි අදහස ලියා දක්වන්න.
 (iii) ශ්‍රද්ධාවේ මූලික ප්‍රභේද දෙක නම් කරන්න.
 (iv) ආහාර පරිභෝජනය හා බැඳුණු සෞඛ්‍යා දහම් දෙකක් නම් කරන්න
 (v) දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාවේදි අන්ත දෙකකින් බැහැරව කටයුතු කරයි. එම අන්ත දෙක නම් කරන්න.
 (vi) දස අකුසල් කර්මයන්ගෙන් "මනෝ කර්මයට" අයත් සචේතනික ක්‍රියාවන් දෙකක් නම් කරන්න.
 (vii) සිව් බඹ විහරණයන් නම් කරන්න.
 (viii) යාදිසං වපතේ බීජං ............ මෙම ගාථාව සම්පූර්ණ කරන්න.
 (ix) පොළොන්නරු යුගයේ ගුරුළුගෝමී පඬිතුමන් විසින් රචිත කෘති දෙකක් නම් කරන්න.
 (x) ඉන්දියාවේ ඉපැරණි අජන්තා සිතුවම්වලට නෑකම් කියනු ලබන අනුරාධපුර යුගයේ ඉපැරණි ම චිත්‍ර නිර්මාණය කර ඇති ස්ථාන දෙකක් නම් කරන්න.

02. (i) සිදුහත් බෝසතාණන් වහන්සේගේ චරිතයෙන් ලබා ගත හැකි අභියෝග දෙකක් ලියන්න.
 (ii) ඉන් එක් අවස්ථාවක් කෙටියෙන් පහදන්න.
 (iii) බෝසත් චරිතයේ අභියෝග ඔබේ ජීවිතයට යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

03. (i) ගර්භයේ ස්වරූපය අනුව ස්තූප සය ආකාර වේ. ඉන් දෙකක් නම් කරන්න.
 (ii) ස්තූපයක් ඇඳ එහි කොටස් නම් කරන්න.
 (iii) බුදු දහමෙන් ඔප්නැංවූ කලාශිල්ප අතර චෛත්‍යයට සුවිශේෂී තැනක් හිමිවේ. චෛත්‍ය නිර්මාණ ඇසුරින් ගොඩනැගුණු බාහිර කලා අංග පිළිබඳව විස්තර කරන්න.

04. (i) සුදුසු කල ධනය උපයා නොගෙන පසු තැවෙන කොස්වාලිහිණියකුට උපමා කරනු ලැබූ ධම්ම පද ගාථාව ලියන්න.
 (ii) එම ගාථාවේ සම්පූර්ණ අදහස ලියන්න.
 (iii) ධම්ම පදය ශිෂ්‍ය ජීවිතය අර්ථවත් කර ගැනීමට යොදාගත හැකි ආකාරය විවරණය කරන්න.

05. (i) "හේතුං පටිච්ච සම්භූතං හේතු භංගා නිරුජ්ඣති" යන්නෙහි අරුත පහදන්න.
 (ii) හේතුඵල න්‍යාය හෙවත් පටිච්ච සමුප්පාදයේ කෙටි සූත්‍රය ලියා දක්වන්න.
 (iii) සමාජ ගැටලු විසඳා ගැනීමේදී පටිච්ච සමුප්පාදය යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

06. (i) සිගාලෝවාද සූත්‍රයට අයත් සදිසා වන්දෙන් දෙකක් නම් කරන්න.
 (ii) ශිෂ්‍යයන්ගෙන් ගුරුවරුන්ට ඉටුවිය යුතු යුතුකම් ලියා දක්වන්න.
 (iii) එකිනෙකා අතර යුතුකම් ඉටුකිරීමෙන් අන්‍යෝන්‍ය සුහදතාව මෙන්ම සාරධර්ම ගොඩනැගෙන ආකාරය පහදන්න.

07. පහත සඳහන් මාතෘකා දෙකක් ඇසුරින් කෙටි සටහන් ලියන්න.
 (i) දසරාජ ධර්ම
 (ii) සමථ භාවනාව
 (iii) වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමිපාණන්
 (iv) හතරවන පුස්ථකාරූඪ සංගීතිය

**වර්ෂ අවසාන පරීක්ෂණය** - 2018

**බුද්ධ ධර්මය - 10 ශ්‍රේණිය**

**පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 1 | 21. | 2 | 31. | 1 |
| 02. | 3 | 12. | 3 | 22. | 1 | 32. | 2 |
| 03. | 3 | 13. | 4 | 23. | 1 | 33. | 3 |
| 04. | 3 | 14. | 3 | 24. | 4 | 34. | 3 |
| 05. | 4 | 15. | 1 | 25. | 2 | 35. | 2 |
| 06. | 1 | 16. | 2 | 26. | 1 | 36. | 1 |
| 07. | 2 | 17. | 3 | 27. | 2 | 37. | 2 |
| 08. | 3 | 18. | 3 | 28. | 1 | 38. | 4 |
| 09. | 2 | 19. | 4 | 29. | 2 | 39. | 1 |
| 10. | 4 | 20. | 2 | 30. | 3 | 40. | 1 |

## II කොටස

01. (i) පංච මහා විලෝකනය
(ii) කුසල් දහම් වැඩි දියුණු කිරීමේ මානසික අභ්‍යාසය භාවනාවයි.
(iii) ආකාරවතී ශ්‍රද්ධාව, අමූලිකා ශ්‍රද්ධාව
(iv) "99" පිටුවේ සඳහන් පිළිතුරු කෙරෙහි අවධානය යොමු කරන්න.
(v) කාමසුඛල්ලිකානු යෝගය, අත්තකිලමථානු යෝගය
(vi) අභිද්‍යාව, ව්‍යාපාදය, මිත්‍යාදෘෂ්ටිය (දැඩි ලෝභය, තරහව, වැරදි දැකීම)
(vii) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා
(viii) යාදිසං වපතේ බීජං - තාදිසං හරතේ ඵලං
කල්‍යාණකාරී කල්‍යාණං - පාපකාරීච පාපකං
(ix) අමාවතුර, ධර්මප්‍රදීපිකාව
(x) සීගිරියේ චිත්‍ර හා හිඳගල චිත්‍ර

02. (i) උපත, ශිල්ප හැදෑරීම, පෙරනිමිති දැකීම, නිබ්බුතපද ඇසීම, පස්කම්සුවය අත්හැරීම, පිය රජුගේ අපේක්ෂාවන් ඉටුකිරීම, ආදී කරුණුවල් දෙකකක් ලියා තිබිය ප්‍රමාණවත්. (ල. 2 යි)

(ii) මින් එක් අවස්ථාවක් විස්තර කර තිබිය යුතුය. (ල. 3 යි)

(iii) බෝසත් සිරිතේ අභියෝගාත්මක අවස්ථා ශිෂ්‍ය දිවියට යොදාගන්නා ආකාරය විවරණය කර තිබිය යුතුයි.

03. (i) බුබ්බුලාකාර, ධාන්‍යාකාර, ඝණ්ඨාකාර, ඝඨාකාර, පද්මාකාර, ආමලාකාර මින් 2ක් ලියා තිබේනම් (ල. 2 යි)

(ii)




(iii) වටදාගෙය, වාහල්කඩ, මුරගල, කොරවග්ගල, සඳකඩපහණ මේ ආදී අංග පිළිබඳව විස්තර කර තිබේ නම් ලකුණු ලබා දෙන්න. (ල. 5 යි)

04. (i) අචරිත්වා බ්‍රහ්ම චරියං , අලද්ධා යොබ්බනේ ධනං, ජිණ්ණ කොඤ්චාව ඣායන්ති
ඛීණ මච්චේව පල්ලලේ
(ii) උතුම් සීලාදී පිළිවෙත්හි නොයෙදී තරුණ වියේදී ධනය රැක ගැනීමෙන් වන නූපන් ධනය ඉපදවීමෙන් තොරව ජීවත් වන්නේ වැසි සමයෙහි මසුන් අල්ලා නොගෙන පසුව සිඳීගිය පොකුණ දෙස බලා පසුතැවිලි වන මහලු කොස්වා ලිහිණියන් මෙන් පසු තැවිලි වන්නෝය. (ල. 3 යි)
(iii) ධම්මපද ගාථා 2ක්වත් ඇසුරින් විස්තර කර තිබිය යුතුය. (ල. 5 යි)

05. (i) යමක් හේතුවක් නිසා හට ගනී ද එම හේතුව නැතිවීමෙන් ඵලය ද නැතිවේ. (ල. 2 යි)

(ii) ඉමස්මිං සති ඉදං හෝති
ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති
ඉමස්මිං අසති ඉදං නහෝති
ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති" යනුවෙන් හෝ

මෙය ඇති කල මෙය වෙයි
මෙය නැති කල මෙය නොවෙයි
මෙය ඉපදීමෙන් මෙය උපදී
මෙය නිරෝධය වීමෙන් මෙය ද නිරෝධය වේ. යනුවෙන් සටහන් කර තිබේ නම් (ල. 3 යි)

(iii) සමාජ ගැටලු දෙකක් පටිච්ච සමුප්පාදය ඇසුරෙන් විස්තර කර තිබිය යුතුය. (ල. 5 යි)

06. (i) නැගෙනහිර - දෙමාපිය / දූදරු
දකුණ - ගුරු / සිසු
බටහිර - අඹු / සැමි
උතුර - මිතුරන්
යට - සේව්‍ය/ සේවක
උඩ - ගිහි / පැවිදි මින් දිශා දෙකක් නම් කර ඇත්නම් (ල. 2 යි)

(ii) දුටු විට හුනස්නෙන් නැගිටීම.
අවශ්‍ය උපස්ථාන කිරීම.
අවවාද අනුශාසනා වලට මැනවින් ඇහුම්කන් දීම.
අවශ්‍ය කටයුතු ඉටුකර දීම.
මැනවින් ඉගෙන ගැනීම. (ල. 3 යි)

(iii) දිශා තුනක් තුළින් හෝ පිළිතුරු පැහැදිලි කර දී ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

07. එක් මාතෘකාවට අදාළව ප්‍රමාණවත් පිළිතුරක් සපයා තිබේ නම් ලකුණු 5ක් ලබා දෙන්න.

i. දස රාජධර්ම
රාජ්‍ය පාලනයට අදාල වැදගත් බෞද්ධ ප්‍රතිපත්තියක් ලෙස පැහැදිලි කිරීම.
ගාථාව හෝ කරුණු 10 ලියා විස්තර කොට ඇත්නම් ලකුණු ප්‍රදානය කරන්න.

ii. බෞද්ධ භාවනා ක්‍රම දෙකෙන් එකක් වශයෙන් පැහැදිලි කිරීමත්
ඒ සඳහා භාවිතා කරන සමාධි භාවනාව, චිත්ත භාවනාව වශයෙන් දැක්වීම
පඤ්ච නීවරණ යටපත් කිරීමේ හැකියාව
ලෞකික ධ්‍යාන උපදවා ගත හැකිබව ආදිය ලියා ඇත්නම් නියමිත ලකුණු ප්‍රදානය කරන්න

iii. * වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමි.
* පැවිදි බිමට පත් වීමට පෙර තොරතුරු.
* පැවිදි බිමට පත්වීමට පසු තොරතුරු.
* සිදු කල ශාසනික සේවාව.

iv. * මාතලේ අළුවිහාරයේදී සිදු කල බව.
* වළගම්බා යුගයේ ප්‍රදේශීය පාලකයෙකු අනුග්‍රහ දැක්වූ බව
ත්‍රිපිටකට ආරක්ෂා කිරීම සඳහා සිදු වූ වැදගත් පියවරක් ලෙස විවරණ කොට ඇත්නම් අදාල ලකුණු ප්‍රදානය කරන්න.